මාධ්‍ය නිවේදන අංක 26

මැතිවරණ කොමිෂන් සභාව

## ඡන්දය ලියාපදිංචි වීම සඳහා දේපල අයිතිය අවශ්‍ය නොවේ

2021 ජුනි මස 01 දිනට සාමාන්‍ය පදිංචි ලිපිනයේ ඡන්ද හිමියකු ලෙස ලියාපදිංචි වීම සඳහා සුදුසුකම්ලත් සියළුම පුරවැසියන්ට අයිතියක් ඇත. ඡන්ද හිමියෙකු ලෙස ලියාපදිංචි වීම සඳහා 2021 ජුනි මස 01 දිනට සාමාන්‍ය පදිංචිය පමණක් ප්‍රමාණවත් වන අතර දේපල අයිතිය පිළිබඳව අවධානය යොමු නොකෙරේ. කුලී හෝ බදු නිවැසියන් මෙන්ම අනවසර පදිංචි කරුවන්ට ද අනෙකුත් සුදුසුකම් සම්පූර්ණ කරන්නේ නම් තමන් සාමාන්‍ය පදිංචි ලිපිනයේ ඡන්ද හිමියකු ලෙස ලියාපදිංචි විය හැක. මෙ සඳහා දේපල අයිතිකරුගේ කැමැත්ත හෝ එකඟතාව අවශ්‍ය නොවේ.

පුරවැසියාගේ අත්හළ නොහැකි පරමාධිපත්‍යය බලයට ඡන්ද බලය ද ඇතුළත් වන අතර, ඡන්ද බලය ක්‍රියාත්මක කිරීම සඳහා ඡන්දහිමි නාමලේඛනයේ නම ඇතුළත්ව තිබිය යුතු ය. ඡන්ද හිමියෙකු ලෙස ලියාපදිංචි වීම සඳහා පුරවැසියන්ට බාධා කිරීම අධිකරණයක් මගින් දඩයකට හෝ බන්ධනාගාර ගත කිරීමකට හෝ මේ දෙකටම හෝ යටත් විය යුතු වරදකි.

කුලී නිවැසියන් හෝ බදු නිවැසියන් හෝ අනවසර පදිංචි කරුවන් ඡන්ද හිමියෙකු ලෙස ලියාපදිංචි කිරීම පුරවැසියන්ගේ ඡන්දබලය තහවුරු කිරීම සඳහා පමණක්ම වන බව නිවේදනය කරන අතර, එම ලියාපදිංචි කිරීම දේපල අයිතිය හෝ ස්ථිර පදිංචිය තහවුරු කර ගැනීම සඳහා නොවන බව ද අවධාරණය කරමි.

මෙම ගැටළුව හේතුවෙන් මෙතෙක් ඡන්ද හිමියන් ලෙස ලියාපදිංචි වීමට නොහැකි වූ තැනැත්තන් සිටිනම් 2021.11.17 දිනට පෙර දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල වෙත ඔබගේ හිමිකම් ඉල්ලීම ඉදිරිපත් කළ හැක. ඔබට අවශ්‍ය හිමිකම් ඉල්ලුම්පත් සෑම ග්‍රාම නිලධාරී කාර්යාලයකින්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින්, පළාත් පාලන ආයතනයකින් හෝ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයකින් ලබා ගත හැක. එසේම www.elections.gov.lk අපගේ වෙබ් අඩවියෙන් බාගත කර හැක. මේ සම්බන්ධයෙන් කිසියම් ගැටළුවක් ඇත්නම් දුරකථන අංක: 0112860031, 0112860032 හෝ 0112860034 මගින් අපගේ දුරකථන සහායක මධ්‍යස්ථානය වෙත යොමු කළ හැකි බව කාරුණිකව දන්වමි.

මැතිවරණ කොමිෂන් සභාවේ නියමය පරිදි

සමන් ශ්‍රී රත්නායක
මැතිවරණ කොමසාරිස් ජනරාල්

මැතිවරණ කොමිෂන් සභාව,
සරණ මාවත,
රාජගිරිය.
2021 නොවැම්බර් මස 03